## 291 සගලොවේ දෙවිඳුට

සගලොවේ දෙවිඳුට මහිමයත්
මෙලෝ දන හට සාමයත් වේවා

දෙවිඳුනී සුර රජිඳුනී
මහ බල ඇති දෙවිඳුනී
ඔබව පසසමු ඔබට තුති දෙමු
ඔබේ ගුණ කඳ සමරමින්

ඒක පුතුවන කිතුනි ජේසුනි
දේව අජපොව්වානෙනී
ලොවේ පව් දුරලනුයෙ ඔබමය
යැදුම'පේ පිළිගනු මැනේ

පියතුමගේ මහිමයේ වසනා දේව පුත්
රජිඳාණෙනි
පිය දකුණු පස වැඩ වසන ඔබ
අපට කරුණා කළ මැනේ

සුදතුමන් හා දේව මහිමේ වැඩ වසන
කිතු සමිඳුනී
එකම දෙවිඳුන් පරම උතුමන් සදා වේ
අප සමිඳුනී